කොවිඩ් 19 සති පාසල

සබරගමුව

විෂය- භූගෝල විද්‍යාව ශ්‍රේණිය - 09 ශ්‍රේණිය වාරය-iiiවාරය
සතිය - 01 සතිය

පාඩම - ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ අවකාශීය වෙනස්කම්

පැවරුම අංක - 01

ක්‍රියාකාරකම අංක 01 - ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ අවකාශීය වෙනස්කම් හඳුනා ගනිමු.

හැඳින්වීම - සංවර්ධනය යනු නිරන්තරයෙන් වෙනස්වන ක්‍රියාවලියකි.එය රටින් රටට ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ. සංවර්ධනය මැනීම සඳහා විවිධ දර්ශක භාවිතා කරනු ලබයි.එම දර්ශක හඳුනා ගැනීම මෙම ක්‍රියාකාරකමින් ආවරණය කෙරේ.

* පියවර 01 - 9 ශ්‍රේණිය භූගෝල විද්‍යාව පෙළ පොතේ පිටු අංක 67-70 දක්වා සාවධානව කියවන්න.

* පියවර 02 - භූගෝල විද්‍යාව සටහන් පොත ගෙන පහත ප්‍රශ්නාවලිය සඳහා පිළිතුරු සපයන්න.

පිළිතුරු ලිවිමට පෙර අදාළ ප්‍රශ්නය ලිවීම අනිවාර්ය වන අතර ප්‍රශ්නය යටතේම පිළිතුර ද ලියන්න.

ප්‍රශ්නාවලිය

01 . සංවර්ධනය පිළිබද “ යුනෙස්කෝ ප්‍රකාශය “ අර්ථ දක්වන්න.

02 . සංවර්ධනය මැනීම සඳහා යොදා ගනු ලබන දර්ශක 04ක් ලියන්න.

03 . රටක ළදරු මරණ අනුපාතය වෙනස්වීම කෙරෙහි බලපාන සාධක මොනවාද?

04 . උපතේ දී ආයු අපේක්ෂාව ඉහළ අගයක් ගැනීමට බලපාන සාධක 03ක් ලියන්න.

05 . සාක්ෂරතාව ලෙස හඳුන්වන්නේ කුමක්ද?

06 . යම් රටක සාක්ෂරතා මට්ටම පහල අගයක් ගැනීමට බලපාන සාධක මොනවාද?

පසු වැඩ

ඉහත සඳහන් දර්ශකවල මෑත කාලීන තත්වය ශ්‍රී ලංකාව ඇසුරින් වගු ගත කර දක්වන්න. (මේ සඳහා ශ්‍රී ලංකාවේ මනුෂ සංවර්ධන වාර්තාව උපකාර කර ගන්න.)

- මෑත කාලීන වර්ෂ කිහිපයක් යොදා ගත හැකි නම් වඩාත් වැදගත් වේ.

සැකසුම- M.B.N.දිල්හානි මිය.(ර/නිවි/කෙහෙල්ඕවිටිගම විද්‍යාලය)